# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,844 — 1969 මාර්තු 7 වැනි සිකුරාද — 1969.3.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## II වැනි කොටස–අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... ... | — | පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... | 33 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | 33 | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම ... ... | — | | |



## දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම්

### කිලිනොච්චි මහෙස්ත්‍රාත් උසාවියේ දීය

ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 76 වැනි පරිච්ඡේදයේ 2 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

නඩු අංක. ඒ. 1513/69.

ඉහත සඳහන් නඩුවේ රුපියල් පන්සිය පනහක මුදල (රු. 550) ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 76 වැනි පරිච්ඡේදයේ (නැති වූ දේ පිළිබඳ රෙගුලාසිය) 2 වැනි වගන්තිය යටතේ මෙම උසාවියට ඉදිරිපත් කර ඇති හෙයින් :

ඉහත කී රුපියල් පන්සිය පනහක මුදලට හිමිකම් ඇති අයෙක් කවරෙක් හෝ මෙම දැන්වීමේ දිනය සිට මාස 6 ක තුළ දී මෙම උසාවියේ ඉදිරිපිට දී ඒ කී මුදලට ඔහුගේ හිමිකම් සනාථ කළ යුතු බව මෙයින් දනුම් දෙමි.

කු. වික්නරාජා,
මහෙස්ත්‍රාත්, චාවකච්චේරිය සහ කිලිනොච්චිය.

1969 පෙබරවාරි මස 26 වැනි දින,
චාවකච්චේරියේ මහෙස්ත්‍රාත් උසාවියේ දී ය.

3-160

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### දකුණු පළාත

✓

නංගල්ලේ, දිස්ත්‍රික් නඩු ශාලාවේ දී ය.

ඔවිලානෝ, වගාච්චි දොන් සුවාරිස්....................පැමිණිලිකාරයා.

නොම්මරය : 7645 එදිරිව

1. කළුරුපොකුනේ, වගාච්චිගේ ඩේවිඩ්, (2) ගොයම්බොක්කේ, සුදිරික්කු හෙන්නදිගේ ජේම්ස් අප්පු..............විත්තිකාරයෝ.

ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එන්. ඩබ්ලිව්. කුමාරසිංහ මහතා විසින් සහතික කරන ලද අංක 27143 හා 61. 8. 2 දින දරණ ඔප්පුවෙන් පැමිණිලිකරුට උගස් කරන ලද, 67. 10. 12 දින දරණ නඩු තීන්දුවේ ප්‍රකාර, 68. 9. 9 දින දරණ උසාවි නියෝගයෙන් විකුණන ලෙස නියෝග කර ඇති මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුවන්ට තිබෙන අයිතිවාසිකම් හා ප්‍රයෝජනත් රුපියල් එක්දහස් දෙසිය හැට එකයි ශත පහක් (රු. 1,261.05) අයකර ගැනීම සඳහා වර්ෂ 1969 මාර්තු මස 29 වැනි දින පෙ. ව. 10 පැයට එකී ඉඩමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු නට යෙදෙනු බව මෙයින් දන්වනු ලැබේ.

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ දකුණු ගිරුවා පත්තුවේ ඔවිලානෝ පිහිටි, උතුරට : ලොට් 5 ජේ ; නැගෙනහිරට : ලොට් 5 ජේ, 5 ජී සහ ටී. පී. 316754 ; දකුණට : ටී. පී. 326754 සහ ලොට් 5 ඩී සහ බස්නාහිරට : ලොට් 5 ඩී සහ 5 ඒ යන මෙකී මායිම් තුළ පිහිටි අක්. 0, රූඩ් 2, පර්. 38 ක් විශාල ටී. පී. 343216 දරණ මැටිවලේහේන නමැති ඉඩමේ බිම, වැවිලි සහ එකී පිහිටි සියලු දේවලින් නොබෙදූ ¾ ක් වේ.

ගි. ගුණසිරි ද සිල්වා,
අතිරේක නියෝජ්‍ය පිස්කල්, නංගල්ල.

වර්ෂ 1969 පෙබරවාරි මස 25 වැනි දින,
නංගල්ලේ, නියෝජ්‍ය පිස්කල් කන්තෝරුවේ දිය.

3-182

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

33 – බී 69255—5,823 (69/2)

## ගාල්ල දිස්ත්‍රික් නඩු ශාලාවේ දීය

ගාල්ල මානවිල ටී. ජී. සලමන් අප්පුහාමි ........... පැමිණිලිකාරයා.

නොම්මරය : එස්. 2632 දි.උ. ගාල්ල.

එදිරිව

අහංගම කපුකොරටුවේ බාලසූරියගේ ධර්මදාස ......... විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් රු. 870.60ක් 67.1.20 වන දින සිට ගෙවන තුරු නීති පොලියද රුපියල් 72.98ක් හා රුපියල් 14.27ක් අයකර ගැනීමට වර්ෂ 1969ක් වූ මාර්තු මස 30 දින පූ. ව. 2ට එම ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළයේ මිදිගම පිහිටි උතුරට "බී" අක්ෂර කැබැල්ලේ නො. 2 දරණ කැබැල්ල. නැගෙනහිරට : ගොඩඹිවිට ; දකුණට : "සී" අක්ෂරය ; බස්නාහිරට : අවරියගේනයන මායිම් තුළ පිහිටි රූඩ් 2, පර්චස් 36.33 විශාල බිම් තරම ඇති කෝන්ගහගේන වත්තේ "බී" අක්ෂරය දරණ කැබැල්ලේ නො. 3 දරණ බෙදා වෙන් කළ කැබැල්ලේ ගහකොළ පළතුරු සහ බිමෙන් නොබෙදූ 1/2 පංගුව වේ.

මැ. ග. වින්සන්ට්,
මාතර නියෝජ්‍ය පිස්කල් වෙනුවට.

1969 පෙබරවාරි මස 19 වන දින,
මාතර පිස්කල් කන්තෝරුවේ දීය.

2-139

## සබරගමු පළාත

### පැල්මඩුල්ල ගම්බද උසාවිය

ලෙල්ලපිටියේ පදිංචි පී. ආර්. සිංහගේනයා නොහොත් එල්. ඒ. සමරසිංහ ....................................................පැමිණිලිකාරයා.

නොම්මරය : 1432, 1433, 1435 හා 1436

එදිරිව

කාරංගොඩ පදිංචි කේ. ආර්. පුංචිගේනයා, කේ. ආර්. කිරිගේනයා, බී. ආර්. උංගගේනයා නොහොත් බී. ඩබ්ලිව්. සිරිසෝම සහ බී. ආර්. බාරොන්චියා නොහොත් බී. වී. ගුණසේන..............
........................................................................ විත්තිකරුවෝ.

රු. 129.79 ක් හා පිස්කල් ගාස්තුවද අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවල විත්තිකරුවන්ට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1969 ක්වූ මාර්තු මස 28 දින පෙරවරු 11 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ උඩ පත්තුවේ කුට්ටපිටියේ පිහිටි—

උතුරට : කොහොලන් ඇලෙන් ද ;

නැගෙනහිරට : නාතාවෙන් ද ;

දකුණට : උඩුපිටියෙන් ද ;

බටහිරට : කොහොලන් ඇලෙන් ද මායිම්ව වී පස් (5) පැලක් පමණ වපසරිය ඇති මැදඇල වෙලේ හඳුවල කුඹුර නමැති ඉඩම තින් දම.

ඒ. හෙට්ටිආරච්චි,
සබරගමු පළාතේ පිස්කල් වෙනුවට.

වර්ෂ 1969 ක්වූ පෙබරවාරි මස 10 වෙනි දින,
රත්නපුර පිස්කල් කන්තෝරුවේ දීය.

3-175

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ.**

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දිනවලට පෙර දින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශන යන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත " පිටපත " **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ " ගැසට් " පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. **1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළු දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. 68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | ශ. | | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | ... | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 | 0 | ... | 42 | 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 | 50 | ... | 51 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|---|
| (අ) | i ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලත දී එක කොටසක් | 0 50 | ... | 0 20 |
| | ii ගැසට්පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් | 1 00 | ... | 0 20 |
| (ආ) | i ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 30 | ... | 0 15 |
| | ii ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 60 | ... | 0 15 |

**දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.**

### උපලේඛනය

**1969**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| **ජනවාරි** | 3. 1.69 | සිකුරාද | 24.12.68 | අඟහරුවාද | පෙ.ව. | 3.30 |
| | 9. 1.69 | බ්‍රහස්පතින්ද | 3. 1.69 | සිකුරාද | පෙ.ව. | 3.30 |
| | 16. 1.69 | බ්‍රහස්පතින්ද | 9. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 24. 1.69 | සිකුරාද | 16. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 31. 1.69 | සිකුරාද | 24. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| **පෙබරවාරි** | 7. 2.69 | සිකුරාද | 31. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| | 14. 2.69 | සිකුරාද | 7. 2.69 | සිකුරාද | පෙ.ව. | 3.30 |
| | 21. 2.69 | සිකුරාද | 14. 2.69 | සිකුරාද | පෙ.ව. | 3.30 |
| | 27. 2.69 | බ්‍රහස්පතින්ද | 20. 2.69 | බ්‍රහස්පතින්ද | පෙ.ව. | 3.30 |
| **මාර්තු** | 7. 3.69 | සිකුරාද | 27. 2.69 | බ්‍රහස්පතින්ද | පෙ.ව. | 3.30 |
| | 14. 3.69 | සිකුරාද | 7. 3.69 | සිකුරාද | පෙ.ව. | 3.30 |
| | 21. 3.69 | සිකුරාද | 14. 3.69 | සිකුරාද | පෙ.ව. | 3.30 |
| | 28. 3.69 | සිකුරාද | 21. 3.69 | සිකුරාද | පෙ.ව. | 3.30 |
| **අප්‍රේල්** | 3. 4.69 | බ්‍රහස්පතින්ද | 27. 3.69 | බ්‍රහස්පතින්ද | පෙ.ව. | 3.30 |
| | 11. 4.69 | සිකුරාද | 31. 3.69 | සඳුද | පෙ.ව. | 3.30 |
| | 18. 4.69 | සිකුරාද | 8. 4.69 | අඟහරුවාද | දවල් | 12.00 |
| | 25. 4.69 | සිකුරාද | 18. 4.69 | සිකුරාද | පෙ.ව. | 3.30 |
| | 30. 4.69 | බදාද | 23. 4.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| **මැයි** | 9. 5.69 | සිකුරාද | 30. 4.69 | බදාද | පෙ.ව. | 3.30 |
| | 15. 5.69 | බ්‍රහස්පතින්ද | 9. 5.69 | සිකුරාද | පෙ.ව. | 3.30 |
| | 22. 5.69 | බ්‍රහස්පතින්ද | 15. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 30. 5.69 | සිකුරාද | 22. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| **ජූනි** | 6. 6.69 | සිකුරාද | 30. 5.69 | සිකුරාද | දවල් | 12.00 |
| | 13. 6.69 | සිකුරාද | 6. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | 20. 6.69 | සිකුරාද | 13. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | 27. 6.69 | සිකුරාද | 20. 6.69 | සිකුරාද | පෙ.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි